★ A handbook with a priceless message



# සොබාදහම සහ නිර්මාතෘ හඳුනා ගැනීමට...

# To recognize nature and the creator...

Sudesh Jayantha

## සොබාදහම සහ නිර්මාතෘ හඳුනා ගැනීමට...

මිනිසා සොබාදහමේ අපූරුම දෙයකි. බුදුදහමට අනුව, ජීවියෙකුට දිව්‍ය ලෝකවලම ජීවත් වීමට අවස්ථාව ලැබෙනවාට වඩා මිනිස් පැවැත්මක් ලැබීම භාග්‍යයකි. නමුත්, කුමන ලෝකයක ජීවත් උවත් ජීවියෙකු නිවනට ළඟා වන තෙක් සංසාරයේ ඉතා දිගු ගමනක් යයි. දේවධර්මයට අනුව මිනිසුන් යනු දෙවියන්වහන්සේගේ විශේෂ මැවීමක් වන අතර ඔහුගේ අනෙකුත් මැවීම්වලට වඩා ඔවුන් බොහෝ වරප්‍රසාද හිමිකරගෙන තිබේ. කෙසේ වෙතත්, එහිදීත් මිනිසාගේ ගමනාන්තය ස්වර්ගය හෝ නිරය වන අතර, ඔහුට අනන්ත කාලයක් එහි රැඳී සිටීමට සිදුවනු ඇත. මේ අනුව බලන කළ ලෝකය තුල මිනිසුන් කුමන ආකාරයේ විශ්වාසයන් සහ ඇදහිලි සහිතව ජීවත් වුවද ඔවුන්ට සොබාදහම තුළ ඉතා දීර්ඝ ගමනක් ඇත.

ඉතා කෙටි වූ මෙලොව ජීවිතයේදී සොබාදහමෙහි සුළු කොටසක් අපි දකින්නෙමු. එහෙත් මෙලොවදී අපට නොපෙනෙන සොබාදහම සහ මරනින් මතු අප මුහුනදෙන සොබාදහමේ ස්වභාවය කෙසේ විය හැකිද? ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති වුවහොත් එහි අපගේ මෙලොව වගකීම සහ පරලොව ස්වභාවය නිසි ලෙස හඳුනා ගැනීමට නොහැකිව අප අපගේ අනන්ත වූ ඉරණම සම්බන්ධයෙන් මහත් සේ පාඩු ලබන්නන් බවට පත්විය හැක. එහෙත්, මෙම අද්විතීය මිනිස් ජීවිතය තුළදීම අපට මෙම විශ්මිත සොබාදහම යනු කුමක්දැයි දැන ගැනීමට හැකියාව ඇත.

තමන් ඇතුළුව සොබාදහම අහඹුවක් විය නොහැක. එය කාගේ හෝ සැලසුම් සහගත නිමැවුමක් විය යුතුය. එසේනම් එහි නිමැවුම්කරු, එය පාලනය කරන්නා සහ පෝෂණය කරන්නා කවුරුන්ද, ඔහුත් අපත් අතර ඇති සම්බන්ධතාවය කෙසේ විය යුතුද...?

පාඨකයාට සොබාදහමේ ස්වභාවය සහ එහි හිමිකරු හඳුනා ගැනීමටත්, එමඟින් තමන්ව සහ තමන්ගේ මෙලොව ජීවිතයේ අරමුණ හඳුනා ගැනීමටත්, පරලොව ස්වභාවය වටහා ගැනීමටත් ඉතා පැහැදිලි තොරතුරු රාශියක් (සාධකද සහිතව) මෙහි අඩංගු වේ. මෙය ඕනෑම මට්ටමක සිටින කෙනෙකුට භාවිතා කළ හැකි දිව්‍ය හෙළිදරව් සහිත වටිනා අත්පොතකි.

සුදේෂ් ජයන්ත

# සොබාදහම සහ නිර්මාතෘ හඳුනා ගැනීමට...

සුදේෂ් ජයන්ත

මිල කළ නොහැකි පණිවිඩයක් සහිත අත්පොතක්

SCAN ME


A handbook with a priceless message
සොබාදහම් සහ නිර්මාතෘ හඳුනා ගැනීමට...
To recognize nature and the creator...
Sudesh Jayantha